# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය

**2026 මාපිය/ රැක බලාගන්න න්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය වෙත සාදරයෙන් පිළිගනිමු**

**ඔබගේ භාෂාව පහතින් තෝරා ගන්න:**

- English
- عَرَبِي [අරාබි]
- Tiếng Việt [වියට්නාම]
- 简体中文 [මැන්ඩරින්]
- ලයිහොල් [හකා චින්]
- हिन्दी [හින්දි]
- ελληνικά [ග්‍රීක්]
- 日本語 [ජපන්]
- අෆ් සෝමාලි [සෝමාලි]
- Türkçe [තුර්කි ]
- ਪੰਜਾਬੀ [පන්ජාබි]

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය

**2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය වෙත සාදරයෙන් පිළිගනිමු**

ඔබගේ දරුවාගේ පාසැලේ නම ඇතුලත් කිරීමෙන් ආරම්භකර, ඉන් පසු අදාළ පාසැල පහතින් ඇති ලැයිස්තුවෙන් තෝරා ගන්න.

**පාසල් නාමය:** [මණ්ඩපයේ නම නොමැතිව, පාසල් නාමය පමණක් පෙන්වන්න]

ඔබගේ දරුවාගේ පාසැලේ නම ඇතුලත් කිරීම ආරම්භ කරන්න

[පාසල බහු-මණ්ඩප නොවේ නම්, පහත ස්වයංක්‍රීයව තෝරාගත් එකම මණ්ඩපයේ නම පෙන්වන්න]

[පාසල බහු මණ්ඩප නම්, දෙමාපියන්/රැකබලා ගන්නන් පහත ස්වයංක්‍රීය ලැයිස්තුවෙන් මණ්ඩපයේ නම තෝරා ගත යුතුය]

**මණ්ඩපයේ නම:**

- [මණ්ඩප නම #1]
- [මණ්ඩප නම #2]
- [ඇතුළු]

**ඔබගේ දරුවාගේ පාසැලේ නම වන්නේ:**

[පාසල් හා මණ්ඩප නාමය]

ඔබගේ දරුවාගේ පාසැලෙන් ලබා දී ඇති පාසැල් පුද්ගල හැඳුනුම් අංකය (PIN) පහතින් ඇතුලත් කරන්න.

**පාසැලේ පුද්ගල හැඳුනුම් අංකය(PIN) (ඉලක්කම් 6 හෝ 8 ක්):**

පාසැල් පුද්ගල හැඳුනුම් අංකය ඇතුලත් කරන්න

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය

[පාසල් නම සමග PIN අංකය නොගැලපෙන විට දෝෂය: ඔබ ඇතුළත් කළ සමීක්ෂණ PIN අංකය නිවැරදි නොවේ. නිවැරදි PIN අංකය ලබා ගැනීම සඳහා ඔබගේ දරුවාගේ පාසැල සමග සම්බන්ධ වන්න]

[මිනිත්තු 60 කින් සමීක්ෂණය කල් ඉකුත් වූ විට දෝෂය: සමීක්ෂණය පැය 1ක් භාවිතා නොකිරීම නිසා කාලය ඉකුත් වී ඇත. සමීක්ෂණය දිගටම කිරීමටකරුණාකර නැවත ලොග් වන්න]

**2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය වෙත සාදරයෙන් පිළිගනිමු**

**[පාසල් හා මණ්ඩප නාමය]** දරුවාගේ මාපියන්/රැක බලාගන්නා ඔබ බව සහ සමීක්ෂණය සම්පූර්ණ කරන ලෙස පාසැල ඔබෙන් ඉල්ලා ඇති බව තහවුරු කරන්න:

- ඔව්
- නැහැ

➡

[මව්පියන් විසින් 'නැත' යන්න තෝරුවහොත්: කරුණාකර ඔබගේ පාසැලේ විස්තර පරීක්ෂා කර බලන්න - ඔබට සමීක්ෂණ PIN අංකය ලබාදුන් පාසැල තෝරා ගත යුතුය.]

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය



## 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය වෙත සාදරයෙන් පිළිගනිමු

දරුවාගේ මාපිය/රැක බලාගන්නා /භාරකරුවන්ගේ අදහස් විමසා බැලීම මගින් ශිෂ්යයන්ගේ අවශ්යතා කොතරම් හොඳින් අපගේ පාසැල් ප්රජාව සපුරනවාද යන කාරණය පිළිබිඹු කරන වැදගත් දර්ශකයකි. මෙම සමීක්ෂණය මඟින් ඔබගේ ළමයාගේ ඉගෙනීම සහ ඔහුගේ/ඇයගේ පාසල පිළිබඳ ප්රශ්න අසනු ඇත. මෙම වැදගත් සමීක්ෂණයට ඔබ ලබා දෙන අදහස් අපි අගය කරමු.


අධ්යාපන දෙපාර්තමේන්තුව සමීක්ෂණයේ ප්රතිපල පර්යේෂණ අවශ්යතා සඳහා සහ ශිෂ්යයන්ගේ අභිවෘධිය නගාලීමට උපයෝගී කර ගනු ඇත. පාසල් සංවර්ධන වැඩසටහන් සඳහා සහාය ලබාදීමට පාසල් මෙම ප්රතිඵල භාවිතා කරනු ඇත.

සහභාගී වීම ස්වේච්ඡාමය වන අතර, මෙම සමීක්ෂණය සම්පූර්ණ කිරීමට මිනිත්තු 15–20 ක් පමණ ගත වේ.


මෙම සමීක්ෂණයට ඔබ ලබා දෙන ප්රතිචාර නිර්නාමික වන අතර, පර්යේෂණ ප්රතිඵලයෙන් කිසිදු පුද්ගලයෙකු හඳුනාගත නොහැක. අධ්යාපන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඔරිම රිසච් (ORIMA Research) විසින් මෙම සමීක්ෂණය පවත්වනු ලබයි. 1988 පෞද්ගලිකත්ව පනතේ අන්තර්ගත මූලධර්ම යටතේ ඔබගේ අයිතිවාසිකම්වලට ගරු කිරීමට සහ ආරක්ෂා කිරීමට ඔරිම රිසර්ච් ක්රියා කරයි. ඔරිම රිසර්ච් පෞද්ගලිකත්වය (අලෙවි සහ සමාජ සමීක්ෂණ )කේත අංක 2021 මෙන්ම අදාල ප්රාන්ත හා ප්රාදේශීය නීති පද්ධතීන්ටද අනුගත වෙයි. ඔරිම හි පූර්ණ පෞද්ගලිකත්ව ප්රතිපත්තිය කියවීමට, කරුණාකර මෙතැන ක්ලික් කරන්න (ඉංග්රීසි පිටපත පමණි).

## උපදෙස්

- කරුණාකර ඔබ පිළිතුරු දීමට පෙර සෑම ප්රශ්නයක්ම පරිස්සමින් කියවන්න.
- ඔබට දීමට අවශ්ය පිළිතුර පරිමාණයේ නියෝජනය කරන විකල්පය තෝරන්න. මෙය විවිධ උපාංගවලදී වෙනස් ලෙස පෙනෙනු ඇත.
    - **පරිඝණකයක හෝ ලැප්ටොප් එකකින් සමීක්ෂණය සම්පූර්ණ කරන්නේ නම්:** උදාහරණ වශයෙන්, ඔබ කසළ දැමීම තහනම් කිරීමට එකඟ වන්නේ නම්, පහත පෙන්වා ඇති ආකාරයට 'එකඟ වන්නේය' යන්න තෝරා ගත යුතුය.




- **ජංගම දුරකථනයකින් සමීක්ෂණය සම්පූර්ණ කරන්නේ නම්**: උදාහරණයක් ලෙස, ඔබට කසළ දැමීම තහනම් කළ යුතු බවට එකඟ නම්, පහළ දැක්වෙන පරිදි කරුණාකර ඩ්‍රොප් ඩවුන් මෙනුව මත ඔබ ක්ලික් කර 'එකඟයි' යන්න තේරිය යුතුය.




- විකල්පය '}එකඟ වන්නේවත් එකඟ නොවන්නේ වත් නැහැ' තෝරා ගත යුත්තේ ප්‍රතිචාරය සාමාන්‍ය හෝ මිශ්‍ර මතයක් දරන බව වාර්තා කිරීම ඔබේ අභිමතය බව මෙම විකල්පය මගින් ඇත්ත වශයෙන්ම පිළිබිඹු වේ නම් පමණකි යන්න සටහන් කර ගන්න. වෙනත් පිළිතුරක් නොමැති නිසා ප්‍රතිචාරයක් ලෙස එය තෝරා නොගත යුතුය.

## උපකාර

ඇතුළු වීම, ලොගින් (LOGIN), පිළිබඳ ගැටළු හෝ තාක්ෂණික ප්‍රශ්න හෝ සම්බන්ධව කරුණාකර 1800 654 585 (කාර්යාල වේලාව තුළදී ගාස්තු අය නොකරන) අංකය අමතන්න. නැතහොත්, ඊමේල් මගින් (විමසීම් ඉංග්‍රීසියෙන් පමණක්) pos@orima.com වෙත යොමු කරන්න.

හිතවත් [School and Campus name] මාපියනි /රැක බලාගන්නනි /භාරකරුවනි

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය



*ඔබගේ දරුවාගේ පාසැලේ වෙනත් මාපියන් සහ රැක බලාගන්නන්සම්බන්ධ කරදී වටිනා අදහස් ලබා දීම සම්බන්ධයෙන් ඔබට ස්තුතියි. ඔබගේ අදහස් අපගේ පාසැල වැඩිදියුණු කිරීමට උපකාරවේ.*

## කරුණාකර ඔබගේ දරුවාගේ වසර තෝරා ගන්න:

*ඔබට මෙම පාසැලේ එක් දරුවෙකුට වඩා සිටීනම්, ඉතාම මෑතදී උපන් දිනය තිබූ දරුවාගේ වසර තෝරාගෙන, ඉතිරි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී මෙම දරුවා ගැන හිතේ තබා ගන්න. එකම උපන්දිනය ඇති ළමුන් කිහිප දෙනෙක් සිටින විට, සමීක්ෂණයේ ඉතිරි කොටස සඳහා එක් අයෙකුව තෝරා ගන්න.*

1 පෙර පාසැල
2 වසර 1
3 වසර 2
4 වසර 3
5 වසර 4
6 වසර 5
7 වසර 6
8 වසර 7
9 වසර 8
10 වසර 9
11 වසර 10
12 වසර 11
13 වසර 12
14 ශ්‍රේණියක් නොමැත

[ඉගෙන ගන්නා වසර = 10 වසර, 11 වසර, හෝ 12 වසර] ඔබේ දරුවා දැනට ඉගෙන ගන්නේ කුමන සුදුසුකමක් සඳහාද?

*සැලකිය යුතුයි: මේ ප්‍රශ්නයට ප්‍රතිචාර දැක්වීමේදී ඔබේ දරුවා ඉගෙන ගන්නේ වී සී ඊ වොකේෂනල් මේජර් (VCE Vocational Major) සඳහා නම් පහත දැක්වෙන දෙවන විකල්පය තෝරා ගන්න. වැඩිමනත් තොරතුරු සඳහා මෙතැන ක්ලික් කරන්න.*

1 වික්ටෝරියානු අධ්‍යාපන සහතිකය (VCE) Victorian Certificate of Education
2 වික්ටෝරියානු අධ්‍යාපන සහතිකය (VCE) වොකේෂනල් මේජර් Victorian Certificate of Education (Vocational Major)
3 වික්ටෝරියානු පාත්වේස් සහතිකය Victorian Pathways Certificate (VPC)
4 ජාත්‍යන්තර ප්‍රථම උපාධිය International Baccalaureate (IB)

## 5 ස්ථිරවම කිව නොහැක

# ඔබේ දරුවාගේ ඉගෙනීම පිලිබඳ

ඔබේ දරුවාගේ අධ්‍යාපනය පිලිබඳ අංගයන් පහත ප්‍රකාශයන්ගෙන් විස්තර කරයි.

එක් එක් ප්‍රකාශයන් සඳහා නිවැරදි යයි ඔබට හැඟෙන ප්‍රකාශයන්ට ඔබ කොපමණ දුරකට එකඟ වන්නේද හෝ එකඟ නොවන්නේද යන්න අදාල කොටුව තෝරා පෙන්වා දෙන්න.

*ඔබගේ ප්‍රතිචාරයට 2026 ඔබගේ අත්දැකීම් පාදක කර ගන්න. පහත ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී, ඔබට පාසැලේ එක දරුවකුට වඩා සිටී නම් කරුණාකර ළඟම උපන් දිනය යෙදෙන දරුවා ගැන සිතන්න.*

| | | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟයි |
|---|---|---|---|---|---|---|
| 1 | මගේ දරුවා පාසැලේ ඔවුන් කරන ඉගැනීමෙන් සතුටු වෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 2 | පාසැල මගේ දරුවාට ගෞරවයෙන් සලකයි | 1 | 2 | 3 | 4 | 5 |
| 3 | ඔවුන්ගේ අලුත් වසරේ ශ්‍රේණියට හුරු වීම සඳහා මගේ දරුවාට මේ වසරේදී සහාය ලැබී ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 4 | මගේ දරුවාට පාසැල ආරක්ෂා සහිත බව දැනෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 5 | තර්ජනකාරී හැසිරීම් වලට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳව පාසැලේදී උගත් නිපුණතාවන් හා උපාය මාර්ග ගැන මගේ දරුවා විශ්වාසයෙන් සිටී. | 1 | 2 | 3 | 4 | 5 |
| 6 | පාසැලේ අනෙක් ශිෂ්‍යයන් තමාව පිළිගෙන ඇති බව මගේ දරුවාට හැඟෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 7 | වගකීම් දැරීමේ අවබෝධය සඳහා මගේ දරුවාට මෙම පාසලෙන් අවස්ථාව සැලසෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 8 | මෙම පාසැලේ ශාස්ත්‍රීය මානකයන් මගේ දරුවාට ප්‍රමාණවත් අභියෝග සලසා දෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 9 | ඉගෙනීමේ දුෂ්කරතා ඇති විට නොපසුබටව ක්‍රියා කිරීමට පාසැල මගේ දරුවා දිරිමත් කරයි | 1 | 2 | 3 | 4 | 5 |

| | | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟයි |
|---|---|---|---|---|---|---|
| 10 | පන්තියේ වැඩ වලදී ඔවුන්ට තමන් උනන්දුවන දේවල් සම්බන්ධයෙන් ගවේෂණය කිරීමට මගේ දරුවාට හැකිය | 1 | 2 | 3 | 4 | 5 |
| 11 | මගේ දරුවා මෑත කාලයේදී තර්ජනකාරී ක්රියාවන්ට මුහුණ දී ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 12 | තීරණ ගැනීමටත් ගැටළු විසඳීමටත් මගේ දරුවාට පාසැල අවස්ථා සලසා දී ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 13 | මගේ දරුවා උනන්දුවක් දක්වන කරුණු හා හැකියාවන් සඳහා මෙම පාසැල විවිධ වැඩ සටහන් සලසා දෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 14 | ඔවුන්ගේ ආත්ම විශ්වාසය ගොඩ නගා ගැනීම පිණිස පාසැල මගේ දරුවාට අවස්ථා සලසා දෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 15 | පාසැලේ ක්රියාකාරකම් සඳහා සහභාගී වීමට පාසැල මගේ දරුවාට අවස්ථා සලසා දෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 16 | ගෙදර වැඩ සහ/හෝ පාසැල් වැඩ සම්භාරය කළමනාකරණය කර ගැනීමට උපකාර වීම පිණිස මගේ දරුවාට සංවිධානාත්මක නිපුණතාවන් උගන්වයි | 1 | 2 | 3 | 4 | 5 |
| 17 | මගේ දරුවාගේ අධ්යාපනයට හවුල් වීමට පාසැල මට අවස්ථා ලබා දෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 18 | මෙම පාසැල මගේ දරුවාට ඉහල ගණයේ අධ්යාපනයක් ලබා දෙන බව මට විශ්වාසය | 1 | 2 | 3 | 4 | 5 |
| | [විශේෂ පාසල් සඳහා පමණි] මාගේ දරුවාගේ 'ශිෂ්ය උපකාර කණ්ඩායම' ක්රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් මම සෑහීමකට පත් වෙමි | 1 | 2 | 3 | 4 | 5 |
| | [විශේෂ පාසල් සඳහා පමණි] මගේ දරුවාට ලැබෙන විශේෂඥ උපකාරක සේවා උසස් මට්ටමක ඇත | 1 | 2 | 3 | 4 | 5 |

හිතවත් [පාසැලේ සහ මණ්ඩපයේ නම] මාපියනි /රැක බලාගන්නනි

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය



## මෙම පාසැලේ ගුරුවරුන් සම්බන්ධව

පහත ප්‍රකාශන මගින් මෙම පාසැලේ ගුරුවරුන් සම්බන්ධ කරුණු පැහැදිලි කරයි.

එක් එක් ප්‍රකාශයන් සඳහා නිවැරදි යයි ඔබට හැඟෙන ප්‍රකාශයන්ට ඔබ කොපමණ දුරකට එකඟ වන්නේද හෝ එකඟ නොවන්නේද යන්න අදාල කොටුව තෝරා පෙන්වා දෙන්න.

*ඔබගේ ප්‍රතිචාරයට 2026 ඔබගේ අත්දැකීම් පාදක කර ගන්න. පහත ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී, ඔබට පාසැලේ එක දරුවකුට වඩා සිටී නම් කරුණාකර ළඟම උපන් දිනය යෙදෙන දරුවා ගැන සිතන්න.*

| | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟයි |
|---|---|---|---|---|---|
| 19 උගැන්වීම පිළිබඳව ගුරුවරු උද්යෝගවත් මෙන්ම ධනාත්මකද වෙති | 1 | 2 | 3 | 4 | 5 |
| 20 මෙම පාසැලේ ගුරුවරුන් සහ මාපියන්/රැක බලා ගන්නන් අතර පලදායී ද්වි මාර්ග සන්නිවේදනයක් ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 21 ඉගෙනීමේදී, මගේ දරුවාට අවශ්‍ය වූ විට ගුරුවරුන්ගෙන් අතිරේක උපකාර ලැබේ | 1 | 2 | 3 | 4 | 5 |
| 22 මගේ දරුවා ඔවුන්ගේ උපරිමයෙන් ඉගෙනීම කරන බව මෙම පාසැලේ ගුරුවරු අපේක්ෂා කරති | 1 | 2 | 3 | 4 | 5 |
| 23 මාගේ දරුවාගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරම් අවස්ථා ප්‍රමාණයක් ගුරුවරුන් මා සමඟ සන්නිවේදනය කරයි (උදා. ඉගෙනීම, සුබසාධනය සහ නිරතවීම/ පැමිණීම ඇතුළුව) | 1 | 2 | 3 | 4 | 5 |
| 24 ගුරුවරු ප්‍රයෝජනවත් තොරතුරු සපයන අතර මගේ දරුවාගේ | 1 | 2 | 3 | 4 | 5 |

| | | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟයි |
|---|---|---|---|---|---|---|
| | ඉගෙනීම් අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වති | | | | | |
| 25 | මගේ ළමයාගේ වාර්තාව අවබෝධ කර ගැනීමට පහසුයි. | 1 | 2 | 3 | 4 | 5 |
| 26 | මගේ ළමයාගේ වාර්තාව ඔවුන්ගේ සාර්ථකත්වය සහ ප්‍රගතිය පැහැදිලිව පෙන්වයි. | 1 | 2 | 3 | 4 | 5 |
| 27 | මගේ දරුවා අගයනු ලබන්නේ කෙසේ දැයි මට වැටහේ | 1 | 2 | 3 | 4 | 5 |
| 28 | ඉගෙනීම සිත් ගන්නා අයුරින් කිරීමට ගුරුවරු ඉතා දක්ෂ වෙති | 1 | 2 | 3 | 4 | 5 |
| 29 | ඉගෙනීම සඳහා ගුරුවරුන් තමාව උනන්දු කරවන බව මගේ දරුවාට හැඟෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 30 | මෙම පාසලේ ගුරුවරු ධනාත්මක හැසිරීමට ආදර්ශයක් වෙති | 1 | 2 | 3 | 4 | 5 |

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය



*ඔබ දැනටමත් සමීක්ෂණයෙන් භාගයක් අවසන් කර ඇත. ඔබගේ අදහස් අපගේ පාසැලේ සියළුම සිසුන් සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම් කිරීමට ඉතා අගනේය.*

## අපේ පාසැල ගැන

පහත දැක්වෙන ප්රකාශ පාසැලේ වාතාවරණයේ අංග සහ පාසැල් ප්රජාව සමග පවතින සම්බන්ධතාවය විස්තර කරයි.

එක් එක් ප්රකාශයන් සඳහා නිවැරදි යයි ඔබට හැඟෙන ප්රකාශයන්ට ඔබ කොපමණ දුරකට එකඟ වන්නේද හෝ එකඟ නොවන්නේද යන්න අදාල කොටුව තෝරා පෙන්වා දෙන්න.

*ඔබගේ ප්රතිචාරයට 2026 ඔබගේ අත්දැකීම් පාදක කර ගන්න. පහත ප්රශ්නවලට පිළිතුරු දීමේදී, ඔබට පාසැලේ එක දරුවකුට වඩා සිටී නම් කරුණාකර ළඟම උපන් දිනය යෙදෙන දරුවා ගැන සිතන්න.*

| | | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟ වෙයි |
|---|---|---|---|---|---|---|
| 31 | මෙම පාසැලේ මැනවින් නඩත්තු කරන පහසුකම් සහ පිට්ටනි ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 32 | පාසැලේ ක්රමවත් සන්නිවේදන මාර්ග තුළින් අවශ්ය තොරතුරු ලබා ගැනීමට මට හැකියාව ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 33 | මාපිය/රැක බලා ගන්නාගේ දායකත්වය මෙම පාසැල අගය කරන බව මට හැඟෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 34 | මට තිබිය හැකි කිසියම් සැලකිය යුතු කාරණා සම්බන්ධව මෙම පාසැලෙන් විමසීම පහසු බව මට හැඟෙයි. | 1 | 2 | 3 | 4 | 5 |
| 35 | පළාතේ ප්රජාව සමග මෙම පාසැලට ශක්තිමත් සම්බන්ධතාවක් ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 36 | සියලුම සංස්කෘතික විශ්වාසයන් සහ චර්යාවන්වල වැදගත්කම ගැන මෙම පාසැල සන්නිවේදනය කරයි | 1 | 2 | 3 | 4 | 5 |

| | | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟ වෙයි |
|---|---|---|---|---|---|---|
| 37 | මෙම පාසැල මාපිය/රැක බලා ගන්නාසැලකිලිමත්වන කරුණු සම්බන්ධයෙන් බැරෑරුම් ලෙස සලකයි | 1 | 2 | 3 | 4 | 5 |
| 38 | මගේ පවුලේ විශ්වාසයන් සහ ප්‍රාර්ථනා හට පාසැල ගරු කරයි | 1 | 2 | 3 | 4 | 5 |
| 39 | පාසැල සැම විටම එය ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම අරමුණු කරයි | 1 | 2 | 3 | 4 | 5 |
| 40 | ශිෂ්‍යයන්ගේ ධනාත්මක හැසිරීම වර්ධනය කිරීම කෙරෙහි මෙම පාසැලේ ස්ථිර සාර ප්‍රවේශයක් ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 41 | ස්වකීය ප්‍රබලතාවන් සහ වර්ධනය විය යුතු විෂය පථයන් පිළිබඳව මෙම පාසැලට පැහැදිලි අවබෝධයක් ඇත | 1 | 2 | 3 | 4 | 5 |
| 42 | ශිෂ්‍යයන්ගේ සියලුම ක්ෂේත්‍රයන්හි සාර්ථකත්වයන්ට මෙම පාසැල උපහාර දක්වයි | 1 | 2 | 3 | 4 | 5 |

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය



## ආරක්ෂාව සහ සුබසාධනය

පහත ප්‍රකාශයන් මගින් පාසැලේ ආරක්ෂාව සහ සුබසාධනය සම්බන්ධ කරුණු පැහැදිලි කරයි.

එක් එක් ප්‍රකාශයන් සඳහා නිවැරදි යයි ඔබට හැඟෙන ප්‍රකාශයන්ට ඔබ කොපමණ දුරකට එකඟ වන්නේද හෝ එකඟ නොවන්නේද යන්න අදාල කොටුව තෝරා පෙන්වා දෙන්න.

*2026 ඔබගේ අත්දැකීම් පාදක කරගෙන වැඩිපුර අවස්ථාවල ඔබට දැනෙන ආකාරය සලකා බලන්න. පහත ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී, ඔබට පාසැලේ එක දරුවකුට වඩා සිටී නම් කරුණාකර ළඟම උපන් දිනය යෙදෙන දරුවා ගැන සිතන්න.*

| | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟයි |
|---|---|---|---|---|---|
| 43 මගේ දරුවාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මෙම පාසැල සැලකිලිමත් වෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 44 මගේ දරුවාගේ සුභසාධනය සම්බන්ධයෙන් මෙම පාසැල සැලකිලිමත් වෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 45 මගේ දරුවාගේ ආරක්ෂාව සහ සුභසාධනය සම්බන්ධයෙන් පාසැලේ කා සමග කතා කළ යුතු දැයි මට වැටහේ | 1 | 2 | 3 | 4 | 5 |
| 46 අවශ්‍ය වූ විට මගේ දරුවා සඳහා සුභ සාධන ආධාර සලසා දීමට මෙම පාසැලට හැකිය | 1 | 2 | 3 | 4 | 5 |
| 47 මගේ දරුවාට උපකාරී වීම සඳහා සහාය සේවාවන්ට මගේ පවුල සම්බන්ධ කිරීමට පාසැලට හැකි බව මම දනිමි | 1 | 2 | 3 | 4 | 5 |

**හිතවත් [පාසැල සහ මණ්ඩපයේ නම] මාපියනි /රැක බලාගන්නනි /භාරකරුවනි**

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය

පිටු 7 න් 6

*ඔබ සමීක්ෂණයේ අවසානය ආසන්නයට පැමිණ ඇත. ඔබගේ අගනා අදහස් ලබා දීමට කාලය ගත කිරීම සම්බන්ධයෙන් අපි අගය කරමු.*

## ඉගෙනීම සහ සිසුන්ගේ පැමිණීම සබන්ධ උපකාර

එක් එක් ප්‍රකාශයන් සඳහා නිවැරදි යයි ඔබට හැඟෙන ප්‍රකාශයන්ට ඔබ කොපමණ දුරකට එකඟ වන්නේද හෝ එකඟ නොවන්නේද යන්න අදාල කොටුව තෝරා පෙන්වා දෙන්න.

*2026 ඔබගේ අත්දැකීම් පාදක කරගෙන වැඩිපුර අවස්ථාවල ඔබට දැනෙන ආකාරය සලකා බලන්න. පහත ප්‍රශ්න වලට පිළිතුරු දීමේදී, ඔබට පාසැලේ එක දරුවකුට වඩා සිටී නම් කරුණාකර ළඟම උපන් දිනය යෙදෙන දරුවා ගැන සිතන්න.*

| | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟ වෙයි |
|---|---|---|---|---|---|
| 48 මගේ දරුවාගේ නිවසේ ඉගෙනීම් කටයුතු වලට විශ්වාසයෙන් යුතුව සහාය වීමට මට හැකි බව හැඟෙයි | 1 | 2 | 3 | 4 | 5 |
| 49 මගේ දරුවාගේ ඉගෙනීම සඳහා සහාය වීමට උපකාර වන තොරතුරු මට මෙම පාසැලෙන් ලබා දෙයි | 1 | 2 | 3 | 4 | 5 |

මීළඟ ප්‍රශ්න කිහිපය ඔබගේ ළමයා පාසල් වේලාවට පිටත සහභාගී විය හැකි **පුද්ගලික, ගෙවීම් කළ පුහුණු කිරීම හෝ පාඩම්** පිළිබඳව ඔබගෙන් විමසයි. මෙයට පාසල් විෂයයන් සඳහා ඔබ ගෙවූ පුහුණු කිරීම හෝ පාඩම්, පාසල් ක්‍රීඩා පුහුණු කිරීම, සහ වැඩසටහන්, නර්තනය, භාෂා අධ්‍යනය වැනි කුසලතා මූලික ඉගෙනුම් ඇතුළත් වේ.

50. **පාසල් වේලාවට පිටත**ඔබගේ ළමයා සහභාගී වන, පහත සඳහන් **පුද්ගලික, ගෙවීම් කළ පුහුණු කිරීමේ හෝ පාඩම්** වර්ග මොනවාද? අදාළ සියල්ලම තෝරන්න

ඔබගේ ප්‍රතිචාර 2026 දී ඔබගේ ළමයාගේ සහභාගීත්වය මත පදනම් කරගන්න. ඔබට ළමුන් කිහිප දෙනෙක් තිබේ නම්, පහත ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ආසන්නතම උපන්දිනය ඇති ළමයා ගැන සිතන්න.

1 ඉංග්‍රීසි (උදාහරණයක් ලෙස: ඉංග්‍රීසි පාඩම් හෝ පුහුණු කිරීම)

2 ගණිතය (උදාහරණයක් ලෙස: ගණිත පාඩම් හෝ පුහුණු කිරීම, ගණිත සංගම්)

3 කලා (උදාහරණයක් ලෙස: නර්තනය, නාට්‍ය, සංගීත, මාධ්‍ය කලා, දෘශ්‍ය කලා, දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ පාඩම් හෝ පුහුණු කිරීම)

4 මානවීය විෂයයන් (උදාහරණයක් ලෙස: භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථිකය සහ ව්‍යාපාර, පුරවැසි හා පුරවැසිත්ව පාඩම් හෝ පුහුණු කිරීම)

5 විද්‍යාව (උදාහරණයක් ලෙස: විද්‍යා සංගම්, විද්‍යා පාඩම් හෝ පුහුණු කිරීම)

6 භාෂා (උදාහරණයක් ලෙසඃ ඉංග්‍රීසි නොවන භාෂාවක් ඉගෙනීමට පාඩම් හෝ පුහුණු කිරීම)

7 තාක්ෂණය (උදාහරණයක් ලෙස: කේතනය පිළිබඳ පාඩම් හෝ පුහුණු කිරීම, රොබෝටික්ස් සංගම්)

8 සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපනය සහක්රීඩා (උදාහරණයක් ලෙස සෞඛ්‍ය, ආරක්ෂාව, සුබසාධනය, ශාරීරික ක්‍රියාකාරකම් පිළිබඳ විෂය මූලික පාඩම් හෝ පුහුණු කිරීම හෝ පාසල් මූලික ක්‍රීඩාවක් සඳහා කුසලතා මූලික පුහුණු කිරීම හෝ පාඩම් – උදාහරණයක් ලෙස පාසල් පිටත සිදු කරන සුසුම් පුහුණු කිරීම)

9 වෙනත්

10 ඉහත කිසිවක් නැත – පාසල් වේලාවට පිටත පුද්ගලික, ගෙවීම් කළ පුහුණු කිරීම හෝ පාඩම් කිසිවකටම මගේ ළමයා සහභාගී නොවේ [විශේෂ]

සාමාන්‍යයෙන්, ඔබගේ ළමයා පුද්ගලික, ගෙවීම් කළ පුහුණු කිරීමේදී කොපමණ වාර ගණනක් සහභාගී වේද? (කරුණාකර එක් එක් ප්‍රවර්ගයට වඩාත් සුදුසු වාර ගණන තෝරන්න)

| | දිනපතා | සතියට දින 5 සිට 6 දක්වා | සතියට දින 3 සිට 4 දක්වා | සතියට දින 1 සිට 2 දක්වා | සෑම සති දෙකකටම එක වරක් (දෙසතියකට වරක්) | මසකට වරක් | මසකට එක වරකට අඩුවෙන් /ඉදහිට |
|---|---|---|---|---|---|---|---|
| 51 [Q50.1 = 1 නම් අසන්න] ඉංග්‍රීසි (උදාහරණයක් ලෙස: ඉංග්‍රීසි පාඩම් හෝ පුහුණු කිරීම) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 52 [Q50.2 = 1 නම් අසන්න] ගණිතය (උදාහරණයක් ලෙස: ගණිත පාඩම් හෝ පුහුණු කිරීම, ගණිත සංගම්) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 53 [Q50.3 = 1 නම් අසන්න] කලා (උදාහරණයක් ලෙස: නර්තනය, නාට්‍ය, සංගීත, මාධ්‍ය කලා, දෘශ්‍ය කලා, | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

| | දිනපතා | සතියට දින 5 සිට 6 දක්වා | සතියට දින 3 සිට 4 දක්වා | සතියට දින 1 සිට 2 දක්වා | සෑම සති දෙකකටම එක වරක් (දෙසතියකට වරක්) | මසකට වරක් | මසකට එක වරකට අඩුවෙන් /ඉදහිට |
|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ පාඩම් හෝ පුහුණු කිරීම) | | | | | | | |
| 54 [Q50.4 = 1 නම් අසන්න] මානවීය විෂයයන් (උදාහරණයක් ලෙස: භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථිකය සහ ව්‍යාපාර, පුරවැසි හා පුරවැසිත්ව පාඩම් හෝ පුහුණු කිරීම) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 55 [Q50.5 = 1 නම් අසන්න] විද්‍යාව (උදාහරණයක් ලෙස: විද්‍යා සංගම්, විද්‍යා පාඩම් හෝ පුහුණු කිරීම) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 56 [Q50.6 = 1 නම් අසන්න] භාෂා (උදාහරණයක් ලෙසඃ ඉංග්‍රීසි නොවන භාෂාවක් ඉගෙනීමට පාඩම් හෝ පුහුණු කිරීම) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 57 [Q50.7 = 1 නම් අසන්න]තාක්ෂණය (උදාහරණයක් ලෙස: කේතනය පිළිබඳ පාඩම් හෝ පුහුණු කිරීම, රොබෝටික්ස් සංගම්) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 58 [Q50.8= 1 නම් අසන්න] , ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා (උදාහරණයක් ලෙස සෞඛ්‍ය, ආරක්ෂාව, සුබසාධනය, ශාරීරික ක්‍රියාකාරකම් පිළිබඳ විෂය මූලික පාඩම් හෝ පුහුණු කිරීම හෝ පාසල් මූලික ක්‍රීඩාවක් සඳහා කුසලතා මූලික පුහුණු කිරීම හෝ පාඩම් — උදාහරණයක් ලෙසසෞඛ්‍ය පාසල් පිටත සිදු කරන සුසුම් පුහුණු කිරීම) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

| | දිනපතා | සතියට දින 5 සිට 6 දක්වා | සතියට දින 3 සිට 4 දක්වා | සතියට දින 1 සිට 2 දක්වා | සෑම සති දෙකකටම එක වරක් (දෙසතියකට වරක්) | මසකට වරක් | මසකට එක වරකට අඩුවෙන් /ඉඳහිට |
|---|---|---|---|---|---|---|---|
| 59 [Q50.9 = 1 නම් අසන්න] වෙනත් පුද්ගලික ගෙවීම් කළ පුහුණු කිරීම හෝ පාඩම් | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |

පහත ප්‍රකාශන පාසල් පැමිණීම් සහ නොපැමිණීම් සම්බන්ධයෙනි. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී, නොපැමිණීම් ලෙස සම්පූර්ණ දිනයන්, අර්ධ හෝ දින භාගයන් හෝ ප්‍රමාදවී පැමිණීම/කලින් පිටත්ව යාම සලකන්න.

60. දරුවාගේ නොපැමිණීම සම්බන්ධයෙන් මා සමඟ විවෘත සාකච්ඡා සිදුකිරීම පාසැල මගින් ප්‍රවර්ධනය කරයි.

1 දැඩිසේ එකඟ නොවෙයි

2 එකඟ නොවෙයි

3 එකඟ වන්නේ හෝ නොවන්නේ නැත

4 එකඟයි

5 දැඩිසේ එකඟ වෙයි

6 අදාල නැත - මාගේ දරුවා හට නොපැමිණීම් සම්බන්ධ ගැටළු නැත

61. මාගේ දරුවාගේ පාසැලට පැමිණීම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් සමඟ කටයුතු කිරීමට අවස්ථාව ලබාදෙයි.

1 දැඩිසේ එකඟ නොවෙයි

2 එකඟ නොවෙයි

3 එකඟ වන්නේ හෝ නොවන්නේ නැත

4 එකඟයි

5 දැඩිසේ එකඟ වෙයි

6 අදාල නැත - මාගේ දරුවා හට නොපැමිණීම් සම්බන්ධ ගැටළු නැත

62. පාසැල මාගේ දරුවාගේ පැමිණීම සම්බන්ධයෙන් දුරකථන ඇමතුම්, ඊමේල්, ලිපි හෝ කෙටි පණිවුඩ මගින් කෙළින්ම මා සමඟ සන්නිවේදනය කරයි.

1 දැඩිසේ එකඟ නොවෙයි

2 එකඟ නොවෙයි

3 එකඟ වන්නේ හෝ නොවන්නේ නැත

4 එකඟයි

5 දැඩිසේ එකඟ වෙයි

63. පාසැල් වසර පුරා පැමිණීමේ අපේක්ෂාවන් සහ අත්පත් කරගත දේ සම්බන්ධයෙන් පාසැල ප්‍රජාව සමඟ සන්නිවේදනය කරයි.

1 කිසිවිට නොවේ

2 ඉතා විරළය

3 සමහර විට

4 නිතරම

5 සෑම විටම

64. මාපියන්/ඊක බලාගන්නන්/භාරකරුවන් වශයෙන් අපගේ වගකීම් සහ පැමිණීමේ අපේක්ෂාවන් ලඟා නොවූ විට පාසැල විසින් ගනු ලබන ක්‍රියා මාර්ග ඇතුළු පාසැලට පැමිණීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මට අවබෝධයක් ඇත.

1 කිසිසේත්ම දැනුවත් නැත

2 මදක් දැනුවත් ය

3 තරමක් දැනුවත් ය

4 ප්‍රමාණවත් තරම් දැනුවත් ය

5 ඉතාමත් දැනුවත් ය

65. මාගේ දරුවාගේ නොපැමිණීමට හේතුව නිවැරදිව වාර්තා කිරීමට පාසැල් මාර්ගස්ථ පෝර්ටලය/දුරකථන යෙදුම උපකාරවේ.

1 දැඩිසේ එකඟ නොවෙයි

2 එකඟ නොවෙයි

3 එකඟ වන්නේ හෝ නොවන්නේ නැත

4 එකඟයි

5 දැඩිසේ එකඟ වෙයි

6 අදාළ නොවේ – මෙම අරමුණ සඳහා මට තවමත් මාර්ගගත පෝර්ටලයක්/යෙදුමක් භාවිතා කිරීමට අවශ්‍ය වී නැත

66. මා විසින් දරුවාගේ නොපැමිණීම පාසැලට දැනුම් නොදුන් අවස්ථාවල, ඒ සම්බන්ධයෙන් විමසීමට ඔවුන් එදිනම මා හා සම්බන්ධවේ.

1 කිසිවිට නොවේ

2 කිසි විටෙක නැත

3 සමහර විට

4 සෑම විටම වාගේ

5 සෑම විටම

6 අදාල නැත - කිසි විටෙක පාසැලට දැන්වීම අමතක කර නැත

67. ඔබගේ දරුවා දින කිහිපයක් පාසැලට නොගියහොත්, ඒ සම්බන්ධයෙන් විමසීමට කී වතාවක් පාසැල මගින් දුරකථනයෙන් ඇමතීම හෝ ඊමේලයක් එවීම සිදු කරයිද?

1 කිසිවිට නොවේ

2 ඉතා විරළය

3 සමහර විට

4 නිතරම

5 සැම විටම

6 අදාල නැත - මගේ දරුවා දින කිහිපයක් පාසැලට නොගොස් සිටීම නොකරයි.

68. සාමාන්‍යයෙන් ඔබගේ ළමයා ගැන සිතූ විට, ඔවුන්ට පාසල් දිනය මුළුමනින්ම මග හැරීම පිළිගත හැකි බව ඔබට හැඟෙන්නේ කවර අවස්ථාවලදීද? *අදාළ සියල්ලම තෝරන්න*

1 ඔවුන් සුළු ලෙස අසනීප වූ විට (උදාහරණයක් ලෙස වරින්වර පිසිඹීම, නාසය අවහිර වීම හෝ කැස්ස, හිසරදය, සෙම්ප්‍රතිශ්‍යාව හෝ උදර වේදනාව)

2 ඔවුන් දැඩි ලෙස අසනීප වූ විට (උදාහරණයක් ලෙස වෛද්‍යවරයෙකු හමුවීමට අවශ්‍ය වීම හෝ දිනය මුළුමනින්ම ඇඳෙහි සිටීමට අවශ්‍යවීම)

3 ඔවුන් අසනීප වී ඇති අතර, රෝගය අනෙක් අය වෙත පැතිරීම වැළැක්වීමට නිවසේ සිටිය යුතු අවස්ථාවලදී

4 ඔවුන්ගේ සහෝදරයා/සහෝදරිය අසනීප වූ විට

5 ඔවුන්ට පාසලේ මිතුරු සබඳතා, හිරිහැර කිරීම්, හෝ සමාජ ගැටළු ඇති විට

6 ඔවුන්ට සුබසාධනය සඳහා හෝ විවේකය සඳහා දිනක් අවශ්‍ය වන විට

7 අපි පවුල් නිවාඩුවකට පිටත් වන විට

8 ඔවුන්ගේ උපන්දිනය හෝ වෙනත් විශේෂ දිනක් (උදාහරණයක් ලෙස ආගමික නිවාඩුවක්, පවුල් අවස්ථාවක් හෝ උත්සවයක්) ඇති විට

9 පවුල් හදිසි අවස්ථාවක් ඇති විට

10 ඔවුන්ට නියමිත හමුවක් (උදාහරණයක් ලෙස වෛද්‍ය, දන්ත වෛද්‍ය, චිකිත්සක, හෝ වෙනත් වෛද්‍ය හමුවක්) ඇති විට

11 ඔවුන්ට පාසලට පිටත ක්‍රියාකාරකම් (උදාහරණයක් ලෙස ක්‍රීඩා, සංගීතය ආදිය) සඳහා සහභාගී විය යුතු විට

12 මට අභියෝගයක් ඇති විට, අසනීප විට, හෝ අනෙකුත් කරුණු නිසා මා අතිශය අපහසුතාවයට පත් වී ඔවුන්ට පාසැලට යැවීමට නොහැකි වන විට

13 ඔවුන්ට සුළු මානසික සෞඛ්‍ය ගැටළු (උදාහරණයක් ලෙස අඩු මනෝභාවය, සුළු වශයෙන් විෂාදය, හෝ සුළු වශයෙන් අවුල්සහගත බව ඇති විට)

14 ඔවුන් පාසලට පැමිණීම සම්බන්ධයෙන් මානසික සෞඛ්‍ය අර්බුදයක් හෝ දරුණු මානසික පීඩනයක් අත්විඳිමින් සිටින විට

15 මගේ ආර්ථික ගැටළු ඔවුන්ට පාසලට යාමට අවශ්‍ය දේවල් ලබා දීමට ඇති හැකියාවට බලපාන විට

16 කාලගුණය හොඳ නොවන විට (උදාහරණයක් ලෙස අතිශය උණුසුම්/සීතල/තෙත් අවස්ථා)

17 පොදු ප්‍රවාහන (පාසල් බස් ඇතුළු) නොමැති විට

18 මට ඔවුන්ගේ සහෝදර/සහෝදරියන් හෝ වෙනත් පවුලේ අය බලා ගැනීම සඳහා ඔවුන්ගේ උපකාර අවශ්‍ය වන විට

19 වෙනත් *(විශේෂිතව දක්වන්න)* __________

කෙටුම්පත

# 2026 මාපිය/ රැක බලාගන්නන්ගේ අදහස් විමසා බැලීමේ සමීක්ෂණය



## පාසැල සම්බන්ධයෙන් සාමාන්‍ය වශයෙන් සෑහීමට පත්වීම

එක් එක් ප්‍රකාශයන් සඳහා නිවැරදි යයි ඔබට හැඟෙන ප්‍රකාශයන්ට ඔබ කොපමණ දුරකට එකඟ වන්නේද හෝ එකඟ නොවන්නේද යන්න අදාල කොටුව තෝරා පෙන්වා දෙන්න.

*2026 ඔබගේ අත්දැකීම් පාදක කරගෙන වැඩිපුර අවස්ථාවල ඔබට දැනෙන ආකාරය සලකා බලන්න.*

| | දැඩිසේ එකඟ නොවෙයි | එකඟ නොවෙයි | එකඟ වන්නේ හෝ නොවන්නේ නැත | එකඟයි | දැඩිසේ එකඟ වෙයි |
|---|---|---|---|---|---|
| 69 වික්ටෝරියානු ප්‍රසිද්ධ පාසැල් පද්ධතිය ශිෂ්‍යයන් ඔවුන්ගේ ජීවිතයේ ඊළඟ අදියරට සූදානම් කරන බව මට විශ්වාසයි | 1 | 2 | 3 | 4 | 5 |
| 70 මෙම පාසැල ශිෂ්‍යයන් ඔවුන්ගේ ජීවිතයේ ඊළඟ අදියරට සූදානම් කරන බව මට විශ්වාසයි | 1 | 2 | 3 | 4 | 5 |
| 71 වික්ටෝරියාවේ **රජයේ පාසල් පද්ධතිය** කෙරෙහි ("රජයේ පාසැල්" ප්‍රාන්තයේ හෝ ප්‍රසිද්ධ පාසැල් ලෙසද හැඳින්වේ) මගේ විශ්වාසයක් ඇත. "විශ්වාසය" යනු ශිෂ්‍යයන්ට හොඳ අධ්‍යාපනයක් පාසැල ලබා දෙන බවත් ඔවුන්ගේ ජීවිතයේ ඊළඟ අදියරට සූදානම් කරන බවත්ය. | 1 | 2 | 3 | 4 | 5 |
| 72 මුළුමනින්ම ගත් කල මගේ දරුවා මෙම පාසැලෙන් ලබන අධ්‍යාපනය ගැන මම සෑහීමට පත් වෙමි | 1 | 2 | 3 | 4 | 5 |

# ජන විකාශනය

ඔබ ලබා ඇති ඉහලම අධ්‍යාපන මට්ටම කුමක්ද?

1 පශ්චාත් උපාධිය

2 උපාධිධාරී ඩිප්ලෝමාව/උපාධිධාරී සහතිකය

3 ප්‍රථම උපාධිය

4 උසස් ඩිප්ලෝමාව/ඩිප්ලෝමාව

5 සහතික III/IV

6 වසර 12

7 වසර 11

8 වසර 10

9 සහතික I/II

10 9 වෙනි වසර සහ පහළ

11 නොකියා සිටීමට කැමතියි

ඔබගේ පාසැල ඔබගේ ප්‍රතිචාරය අගය කරයි. පැවසීමට වෙනත් කරුණු තිබේ නම් සෘජුවම ඔබේ පාසල අමතන්න. ඔබගේ දරුවාගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සැලකිය යුතු කරුණු දෙපාර්තමේන්තුවට ඉස්මතු කිරීමට ඇත්නම් තවදුරටත් මග පෙන්වීම් සඳහා පිවිසෙන්න: *අදහස් සහ පැමිණිලි | වික්ටෝරියානු රජය (www.vic.gov.au)*.

## සමීක්ෂණය මෙතනින් අවසන්!

සහභාගී වීම පිළිබඳව ඔබට ස්තුතියි. ඔබගේ ප්‍රතිචාරය වැදගත් වන අතර පාසැල වැඩි දියුණු කිරීමට යොදා ගනු ලබයි.

ඔබගේ සමීක්ෂණයේ ප්‍රතිචාර ඉදිරිපත් කිරීමට ටික් බොත්තම ක්ලික් කරන්න.

 හිතවත් [පාසැලේ සහ මණ්ඩපයේ නම] මාපියනි /රැක බලාගන්නනි /භාරකරුවනි

ඔබගේ සමීක්ෂණයේ ප්‍රතිචාර ඉදිරිපත් කිරීම ගැන ස්තුතියි. ඔබට දැන් මේ කවුළුව වැසිය හැකියි.